සෙත් පිරිත්



සම්පාදනය

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ

සෙත් පිරිත්

සම්පාදනය
පූජ්‍ය වේරගොඩ සාරද
නායක මහා ස්වාමීන්ද්‍රයන්
වහන්සේ

සිංගප්පූරු බෞද්ධ භාවනා
මධ්‍යස්ථානය,
නොම්මර 1, ජලන් මස් පුටේ,
සිංගප්පූරුව 128607
ටෙලි +65 67783330 +65 94656570
weragodas1941@gmail.com

''සබ්බ දානං ධම්ම දානං ජිනාති''
දානයෙන් උතුම්ම දානය ධර්‍ම දානය වේ.

මාගේ ගුරුදේවයාණන් වහන්සේ වන
සිංගප්පූරු බෞද්ධ භාවනා
මධ්‍යස්ථානාධිපති,
සිංගප්පූරුවේ සංඝනායක
අතිපූජ්‍ය වේරගොඩ සාරද නායක
මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට
අවුරුදු 83ක් පිරීම නිමිත්තෙන්
ප්‍රකාශයට පත් කර, ගෞරවයෙන්
දෙපා නැමැද පූජා කරමි.
පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා
ස්වාමීන්ද්‍රයන් වහන්සේට දීර්ඝායුෂත්,
නීරෝගී භාවයත්, චිර ජීවනයත් ඉත
සිතින් ප්‍රාර්ථනා කරමි.

පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ෂුණිය

27. 11. 2024

පටුන

වන්දනා	07
මහා මංගල සූත්‍රය	12
රතන සූත්‍රය	22
කරණීය මෙත්ත සූත්‍රය	40
ජිනපඤ්ජරය	49
ඇණවුම් පිරිත	66
අටවිසි පිරිත	72
මහා ජයමංගල ගාථා	80
ජය පිරිත	92
ජයමංගල ගාථා	102
පින් අනුමෝදන් කිරීම	112

පූජ්‍ය වේරගොඩ සාරද නාහිමියන් ගේ පාලි සජ්ඣායනා ශ්‍රවණයට යූටුබ් (youtube) නාලිකාවට ප්‍රවේශ වන්න

https://www.youtube.com/channel/UC3qCmfeXF7ZAe_Tbjk6mLgg

https://www.youtube.com/channel/UCJcRYIZm_TovBsSmppjC3-g

Via Sound Cloud

https://soundcloud.com/user-155125146

වන්දනා

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

(තෙවරක් කියන්න.)

බුදුන් වැඳීම

ඉති’පි සො භගවා අරහං
සම්මාසම්බුද්ධො විජ්ජාචරණ
සම්පන්නො සුගතො
ලොකවිදූ අනුත්තරො
පුරිසදම්මසාරථී සත්ථා
දේවමනුස්සානං බුද්ධො භගවා’ති

ඒ භාග්‍යවතුන් වහන්සේ රහත් ය. සියලු ධර්මයන් මනා කොට දත් සේක. විද්‍යාචරණ සම්පන්නය. සුගතය. ලෝකවිදූය. අනුත්තර පුරිසදම්මසාරථිය. දෙව්මිනිසුන්ට ශාස්තෘය. බුද්ධය. භගවත් ය.

දහම් වැඳීම

ස්වාක්ඛාතො භගවතා ධම්මො
සන්දිට්ඨිකො අකාලිකො
එහිපස්සිකො ඔපනයිකො
පච්චත්තං වෙදිතබ්බො
විඤ්ඤූහී'ති

භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට වදාරණ ලදි. එය එක් එක් තැනැත්තා විසින් සිය

ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙන් අවබෝධ කොට ගත යුතුය. එහි ප්‍රතිඵල උපන් වහාම පලදෙන්නේ ය. අකාලිකය. පැමිණ බලව යන ඇරයුමට සුදුසු ය. එළඹීමට සුදුසු ය. නුවණැත්තන් විසින් තම තම නැණ පමණින් දත යුතුය.

සඟුන් වැඳීම

සුපටිපන්නො භගවතො සාවකසංඝො උජු පටිපන්නො භගවතො සාවකසංඝො ඤායපටිපන්නො භගවතො සාවකසංඝො සාමීචි පටිපන්නො භගවතො සාවකසංඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවකසංඝො ආහුනෙයෙයා

පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා’ති

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන මනාව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන ඉදිපිළිවෙතට පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඟ රුවන නැණ මගට පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන නිවනට අනුකූල වූ පිළිවෙතට පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන (සෝවාන් මග පිහිටියෝ ද සෝවාන් පලෙහි පිහිටියෝ ද) එක් සඟළෙක යන මේ පුරුෂ යුග සතරක් බැගින්

අෂ්ඨ පුරුෂ පුද්ගලයෝ වන සේක. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ දුරිනුදු ගෙන හැර දියයුතු ප්‍රත්‍යයට සුදුසුය. ආගන්තුක සත්කාර පිළිගන්නට සුදුසුය. දක්ෂිණාවට සුදුසුය. සියලු ලෝ වැස්සන් විසින් දොහොත් මුදුනෙහි තබා කරන නමස්කාරයට සුදුසුය. පුණ්‍ය ක්ෂේත්‍ර භාවයට සුදුසුය. ලෝකයා ගේ උතුම් වූ පින්කෙතය.

ඒතේන සච්ච වජ්ජේන පාතුතං රතනත්තයං

ඒ සත්‍යයේ බලයෙන් ඔබට
තෙරුවන් ගේ
ආශිර්වාදය ලැබේවා.
(තෙවරක් කියන්න.)

මහා මංගල සූත්‍රය

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අථ ඛො අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කේවලකප්පං ජේතවනං ඕභාසෙත්වා යෙන භගවා තෙනු'පසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනනම් වූ අනේපිඬු මහ සිටුහුගේ

ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි එක්තරා දෙවියෙක් රෑ ඉක්මවා ගිය කල්හි විශිෂ්ඨ ශෝභා ඇත්තේ සියලු දෙව්රම් වෙහෙර ස්වකීය ශරීර ශෝභාවෙන් බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටි ඒ දෙවිතෙම ගාථායෙන් (මෙසේ) කීය.

බහූ දෙවා මනුස්සා ච
මංගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං
බ්‍රෑහි මංගලමුත්තමං

මෙලොව පරලොව සැපකැමති වන්නා වූ බොහෝ දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද දියුණුවට හිත කරුණු සිතූහ. වැඩ සලසන ඒ උතුම් මගුල් අපට අනුකම්පාවෙන් වදාළ මැනවි.

අසෙවනා ච බාලානං
පණ්ඩිතානං ච සෙවනා
පූජා ච පූජනීයානං
එතං මංගලමුත්තමං

බාලයන් නොහොත් අසත් පුරුෂයන් සේවනය නොකිරීම ද පණ්ඩිතයන් නොහොත් සත් පුරුෂයන් සේවනය කිරීම ද, පිදිය යුත්තන් පිදීම ද, (යන) මෙය උතුම් මංගලයකි.

පතිරූපදෙස වාසො ච
පුබ්බෙ ච කතපුඤ්ඤතා
අත්ත සම්මා පණිධි ච
එතං මංගලමුත්තමං

සුදුසු දේශයක විසීම ද, පෙර
කරන ලද පින් ඇති බව ද, සිත
මනා දහම්හි පිහිටුවීම ද, (යන)
මෙය උතුම් මංගලයකි.

බාහුසච්චඤ්ච සිප්පඤ්ච
විනයො ච සුසික්ඛිතො
සුභාසිතා ච යා වාචා
එතං මංගලමුත්තමං

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව
ද, ශිල්ප දැනීම ද, මනා කොට

භික්මුණු විනය ඇති බව ද, යම් වචනයක් මොනවට කියන ලද ද, සුබැසි වචනයන් ද, යන මෙය උතුම් මංගලයකි.

මාතා පිතු උපට්ඨානං
පුත්ත දාරස්ස සංගහො
අනාකුලා ච කම්මන්තා
එතං මංගලමුත්තමං

මවුට උපස්ථාන කිරීම ද, පියාට උපස්ථාන කිරීම ද, අඹුදරුවන්ට සංග්‍රහ කිරීම ද, නිරවුල් කර්මාන්ත ඇති බව ද, (යන) මෙය උතුම් මංගලයකි.

දානං ච ධම්මචරියා ච
ඤාතකානඤ්ච සංගහො

අනවජ්ජානි කම්මානි
එතං මංගලමුත්තමං

දන් දීම ද, දස කුසල්කම්හි හැසිරීම ද, නෑයන්ට සැලකීම ද, නිවැරදි ක්‍රියා ද, යන මෙය උතුම් මංගලයකි.

ආරති විරති පාපා
මජ්ජ පානා'ච සඤ්ඤමො
අප්පමාදො ච ධම්මෙසු
එතං මංගලමුත්තමං

පව්කම්වල නොඇලීම ද, අකුශල ක්‍රියා වලින් වැළකීම ද, මත්පැන් බීමෙන් වැළකීම ද, සියලු කුසල් දහම්හි පමා නොවීම ද,(යන) මෙය උතුම් මංගලයකි.

ගාරවො ච නිවාතො ච
සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලෙන ධම්ම සවණං
එතං මංගලමුත්තමං

ගරු කටයුත්තන්ට ගරු කිරීම ද, නිහතමානී බව ද, ලද දෙයින් සතුටු වන බව ද, කෙළෙහි ගුණ දන්නා බව ද, සුදුසු කාලයෙහි බණ ඇසීම ද, (යන) මෙය උතුම් මංගලයකි.

ඛන්ති ච සොවචස්සතා
සමණානඤ්ච දස්සනං
කාලෙන ධම්මසාකච්ඡා
එතං මංගලමුත්තමං

ඉවසීම ද, කීකරු බව ද,
ශ්‍රමණයන් දැකීම ද, සුදුසු කල්හි
ධර්ම සාකච්ඡාව ද, (යන) මෙය
උතුම් මංගලයකි.

තපො ච බ්‍රහ්මචරියඤ්ච
අරියසච්චානදස්සනං
නිබ්බාන සච්ඡිකිරියා ච
එතං මංගලමුත්තමං

තපස ද, උතුම් හැසිරීම ද, ආර්‍ය්‍ය
සත්‍යයන් නුවණින් දැකීම ද, නිවන්
අවබෝධ කිරීම ද, (යන) මෙය
උතුම් මංගලයකි.

ඵුට්ඨස්ස ලොකධම්මෙහි
චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං

එතං මංගලමුත්තමං

අටලෝ දහමින් ස්පර්ශ කරන ලද යමෙකු ගේ සිත නොසැලේ ද, ශෝක රහිත ද, රාගාදී රජස් රහිත ද, නිර්භය ද, (යන) මෙය උතුම් මංගලයකි.

එතා දිසානි කත්වාන
සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති
තං තෙසං මංගලමුත්තමං'ති

(අසත් පුරුෂයන් සේවනය නොකිරීම) ආදී මෙබඳු මංගලයන් කොට සෑම තන්හි උවදුරු නැත්තේ වෙයි. සෑමතන්හි

සැපවත් බවට යෙත්. ඔවුනට ඒ කරුණු තිස් අටම උතුම් මංගල කරුණු වේ.

එතේන සච්ච වජ්ජේන හොතු තෙ ජයමංගලං

ඒ සත්‍යයේ බලයෙන් ඔබට ජය මංගලයක් වේවා.

(තෙවරක් කියන්න.)

රතන සූත්‍රය

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යා නිවඅන්තලික්ඛෙ
සබ්බෙ’ව භූතා සුමනා භවන්තු
අථො’පි සක්කච්ච සුණන්තු
භාසිතං

මෙතැන්හි රැස්වූ පොළොවෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අහසෙහි වූද යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, ඒ සියලු අමනුෂ්‍යයෝ ම සතුටු සිතැත්තෝ වෙත්වා. තව ද මාගේ වචනය සතුටින් අසත්වා.

තස්මා හි භූතානි සාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය

දිවා ච රත්තො ච හරන්තියෙ බලිං
තස්මාහි නෙ රක්ඛථ අප්පමත්තා

භූතයිනි, එබැවින් සියලු තෙපි (මාගේ වචනය) අසවු. මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රී කරවු. යම් කෙනෙක් දහවල් ද රෑ ද පුද පඬුරු පූජාවන් කෙරෙත් ද, එහෙයින් ඔවුන් නොපමාව රකිවු.

යං කිංචි විත්තං ඉධ වා හුරංවා
සග්ගෙසු වා'යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

මේ මිනිස් ලොව හෝ නා ලෝ

ආදී අන් ලොවක හෝ යම් ධනයෙක් වේ ද, ස්වර්ගයෙහි හෝ යම්කිසි උතුම් රත්නයක් වේ ද, (ඔවුන් අතුරෙහි) තථාගතයන් වහන්සේ හා සම වූ කෙනෙක් නොමැත. බුදුරදුන් කෙරෙහි මේ රත්න බව ද උතුම්ය. මේ සත්‍යය බලයෙන් සෙත් වේවා.

ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍ය මුනීසමාහිතො
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

එකඟ වූ සිත් ඇති තථාගතයන් වහන්සේ(කෙලෙසුන් දුරු කරන

හෙයින්) ක්ෂය නම් වූ (රාගයෙන් වෙන් වීමට නිමිති වූ) විරාග නම් වූ වූද, (මරණයක් නැති හෙයින්)අමත නම් වූ යම් නිවණක් අවබෝධ කළේ ද? ඒ ධර්‍මය හා සම වූ කිසිවක් නොමැත. ධර්‍මයෙහි මේ රත්න භාවය ද උතුම් ය. මේ සත්‍යය බලයෙන් සෙත් වේවා.

යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

උතුම් වූ බුදුරජ තෙමේ පිරිසිදු වූ යම් ආර්ය මාර්ගයක් වර්ණනා

කළේ ද, ඉතා පිරිසිදු වූ ඒ මාර්ගය ආනන්තරික සමාධියයි. යම් මාර්ගයක් (බුද්ධාදී ආර්යයෝ) දේශනා කරද්ද ඒ සමාධිය හා සම වූ සමාධියක් නැත. ධර්මයෙහි මේ රත්න භාවය ද උතුම් ය. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්සසාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

සත් පුරුෂයන් විසින් පසස්නා ලද යම් ආර්ය පුද්ගලයෝ අටදෙනෙක්

වෙත් ද, නොහොත් ප්‍රශස්ත වූ යම් එකසිය අටක් ආර්ය පුද්ගලයෝ වෙත් ද, මොහු හැමදෙන සතර යුග කෙනෙක් වෙති. සුගත් බුදුරදුන් ගේ සවු වූ උන්වහන්සේලා සිව් පසය පිළිගැණීමට සුදුස්සෝ වෙති. මේ බුදු සවුවන් කෙරෙහි දෙන ලද දානයෝ මහත් ඵල ඇත්තෝ වෙත්. මේ කරුණින් ද බුද්ධ ශ්‍රාවක සංඝ තෙමේ උතුම්රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්ඛාමිනො ගොතමසාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝෙ රතනං පණීතං

එතෙන සච්චෙන සුවත්ථි හොතු

ගෞතම බුද්ධ ශාසනයෙහි වූ සුවිශුද්ධ කායවාක් කර්ම සංඛ්‍යාත, ශීලස්කන්ධයෙන් යුක්ත වූ ස්ථිර සිතින් යුක්ත වූ ප්‍රඥාව කරණ කොටගෙන සියලු කෙලෙසුන් ගෙන් නික්මුණා වූ යම් පුද්ගල කෙනෙක් වෙත් ද, ඔහු තුමු නිවනට බැස ගෙන නොමිලයේ ම රහත්ඵල සමවත ලැබ ගෙන එය විඳින්නහු වෙති. මේ කරුණින් ද, ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යථින්දඛීලො පඨවිං සිතො සියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියො

තථූපමං සප්පුරිසං වදාමි
යො අරියසච්චානි අවෙච්ච
පස්සති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

යම් සේ පොළොව තුළ වැද ගෙන සිටි ඉන්ද්‍රඛීලය සිවු දිගින් හමන සුළඟින් සෙලවිය හැකි නොවේ ද, චතුරාර්‍ය්‍ය සත්‍ය නුවණින් දකින උතුම් පුරුෂයා (සෝවාන් පුද්ගලයා) එබන්දකු කොට කියමි. මේ කරුණින් ද, ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත්වේවා.

යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි

කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

යම් සෝවාන් පුද්ගල කෙනෙක් ගැඹුරු නුවණැති බුදුන් වහන්සේ දෙසූ ආර්ය සත්‍යයන් තමනට ප්‍රකට කෙරෙත් ද, ඔහු බෙහෙවින් පමාවූවාහු නමුත් අටවැනි උත්පත්තියක් නොගනී. මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

සහාව’ස්ස දස්සන සම්පදාය
තය’ස්සු ධම්මා ජහිතා භවන්ති

සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වා’පි යදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡ චාභිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

මේ සෝවාන් පුද්ගලයා ගේ සෝවාන් මග නුවණ පහළවීම සමගම සත්කාය දෘෂ්ඨියද (කය පිළිබඳ විසි අයුරකින් පැවති) (බුද්ධාදී අටතැන්හි) සැකයද යම් මිතථ්‍යා ශීල ව්‍රත කෙනෙක වූහු නම් ඒ සියල්ල ද යන මේ තුන් සංයෝජනයෝ දුරු කරණ ලද්දෝ වෙති. හෙතෙම සතර අපායන් (නිරය, තිරිසන් ලෝකය, ප්‍රේත ලෝකය, අසුර) කෙරෙන් මිදුනේ

වේ. ආනන්තර්ය කර්ම පසත් මිත්‍යා දෘෂ්ටියත් යන බැරෑරුම් පව් සය කරන්නට ද හේ අභව්‍ය ය. මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

කිඤ්චාපි සො කම්මං කරොති
පාපකං
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බො සො තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

ඒ සෝවාන් පුද්ගල තෙම කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ ප්‍රඥප්ති මාත්‍ර වූ කිසි වරදක්

කරන්නේ නමුදු හේ එය සැඟවන්නට නො හැක්කේ ය. දක්නා ලද නිර්වාණ පදය ඇති සෝවාන් පුද්ගලයා ගේ (වරද සැඟවීමේ) අවශ්‍ය බව බුදුරදුන් විසින් වදාරණ ලද්දේය. මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිංගිම්හෙ
තථූපමං ධම්ම වරං අදෙසයී
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

වන ලැහැබ තෙමේ ග්‍රීස්ම
ඍතුවේ පළමු වන මාසයෙහි
හෙවත් බක් මස සුපිපි අක්
ඇත්තේ යම්සේ ද එසේ වූ නිවන්
පුර පමුණුවන උතුම් ලොවිතුරා
ධර්‍ම රත්නය ලෝසතුන් ගේ හිත
පිණිස බුදුරදුන් දේශනා කළ සේක.
මේ කරුණින් ද බුදුරජ තෙමේ
උතුම් රුවනකි. මේ සත්‍ය
බලයෙන් සෙත් වේවා.

වරො වරඤ්ඤූ වරදො වරාහරො
අනුත්තරො ධම්ම වරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

උතුම් වූ නිවන දන්නා වූ, උතුම් වූ
නිවන දෙන්නා වූ, උතුම් නිවන්

මග ගෙනහැර පාන්නාවූ, අනුත්තර වූ බුදුරජාණන් වහන්සේ උතුම් වූ දහමක් දෙසූ සේක. මේ කරුණින් ද බුදුරජ තෙමේ උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායංපදීපො
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

යම් කෙනෙකු ගේ පුරාතන කර්ම රහත් මගින් ක්ෂීණ වූයේ ද, අලුත් කර්මයන් ගේ පහළ වීමකුත්

නැද්ද, මතු භවයක් කෙරෙහි නො ඇලුණු සිතැති ක්ෂීණ වූ ප්‍රතිසන්ධි විඥාන සංඛ්‍යාත සංස්කාර වෘද්ධිය කෙරෙහි කැමැත්තක් නැති ධෛර්යය සම්පන්න වූ ඒ රහත්හු මේ පහන සේ අවසන් සිත නිරුද්ධ වීමෙන් පිරිනිවෙත්. මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි’ව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු

පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතැන් හි

රැස්වූහු ද ඔහු ද මම ද දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරජාණන් වහන්සේ නමදිමු. සත්ව ප්‍රජාවට සෙත්වේවා.

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි'ව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු

පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතැන් හි රැස්වූහු ද ඔහු ද මම ද දෙව් මිනිසුන් විසින් පුදන ලද බුද්ධාදීන් විසින් අවබෝධ කරන ලද බැවින් තථාගත වූ ධර්මය නමදිමු. සත්ව ප්‍රජාවට සෙත්වේවා.

**යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි’ව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හොතු**

පොළොවෙහි හෝ අහසෙහි වූ
යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතැන් හි
රැස්වූහු ද ඔහු ද මම ද දෙව්
මිනිසුන් විසින් පුදන ලද තථාගත
වූ සංඝයා නමදිමු. සත්ව ප්‍රජාවට
සෙත්වේවා.

**එතෙන සච්ච වජ්ජේන දුක්ඛා වූප
සමෙන්තුතේ**

ඒ සත්‍යයේ බලයෙන් දුක් දුරු
වේවා.

එතෙන සච්ච වජ්ජෙන භයා වූප සමෙන්තුතේ

ඒ සත්‍යයේ බලයෙන් භය දුරු වේවා.

එතෙන සච්ච වජ්ජෙන රෝගා වූප සමෙන්තුතේ

ඒ සත්‍යයේ බලයෙන් රෝග දුරු වේවා.

කරණීය මෙත්ත සූත්‍රය

කරණීය මත්ථකුසලෙන
යං තං සන්තංපදං අභිසමෙච්ච
සක්කො උජූ ච සූජූ ච
සුවචො ච’ස්ස මුදු අනතිමානී

යම් ඒ ශාන්තිපද සංඛ්‍යාත
නිර්වාණයක් වේ ද, එයට පැමිණි
නොහොත් එය අවබෝධ කොට
වසනු කැමැති අභිවෘද්ධිය
සලසා ගැනීමෙහි දක්ෂයා විසින්
එයට සුදුසු දෙය කළ යුතුය.
නිවණට පැමිණ වසනු කැමැත්තේ
සත්‍ය ප්‍රතිවෙධය පිණිස
පිළිපදින්නට නොහොත් කිසුණු
පිරියම් කිරීම් වත් සමාදන්වීම් ආදී
සියලු කාර්යයන් කරන්නට

දක්ෂයෙක් වන්නේය. ඍජු වන්නේය. මනා කොට ඍජු වන්නේය. අන්‍යයන් ගේ අවවාද මනා කොට පිළි ගැනීම් වශයෙන් සුවච වන්නේය. මෘදු වන්නේ ය. අතිමාන ඇත්තේ නොවන්නේය.

සන්තුස්සකො ච සුභරො ච
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියො ච නිපකො ච
අප්පගබ්භො කුලෙසු
අනනුගිද්ධො

ලද දෙයින් සතුටු වන්නෙක් ද, පෝෂණය කළ හැකිකෙනක් වීම ද, සැහැල්ලු පැවැතුම් ඇත්තෙක් ද, සන්සුන් ඉඳුරන් ඇත්තෙක් ද, ප්‍රඥා ඇත්තෙක් ද, හැඩි දැඩි

අසංවර ගති නැත්තෙක් ද,
කුලයන් කෙරෙහි නොඇලුනෙක් ද,
වන්නේ ය.

න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි
යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං
සුඛිනො වා ඛෙමිනො හොන්තු
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

නුවණැති අන්‍යයන් නින්දා කරණ
සුළු වරදක්වත් නො කරන්නේ ය.
සියලු සත්වයෝ සැප ඇත්තෝ
වෙත්වා. භය නැත්තෝ වෙත්වා.
සුඛිත සිත් ඇත්තෝ වෙත්වා යි ද,

යෙ කෙචි පාණ භූත’ත්ථි
තසා වා ථාවරා වා අනවසෙසා
දීඝා වා යෙ මහන්තා වා

මජ්ඣිමා රස්සකා’ණුක ථූලා

තෘෂ්ණා භය සහිත හෙයින් තැති ගන්නා සුලුවූ ද, තෘෂ්ණා භය ප්‍රහීන කළ හෙයින් ස්ථාවරවූ ද, යම් කිසි සත්වයෝ ඇත්තාහු නම්, ඒ සියලු දෙනා ද, දික් ශරීර ඇත්තෝ ද, මහත් ශරීර ඇත්තෝ ද, මධ්‍යම ශරීර ඇත්තෝ ද, මිටි ශරීර ඇත්තෝ ද, ඉතා සියුම් ශරීර ඇත්තෝ ද, ස්ථූල ශරීර ඇත්තෝ ද,

දිට්ඨා වා යෙ’ව අද්දිට්ඨා
යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ
භූතා වා සම්භවෙසී වා
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

ඇස් හමුවට පැමිණීම් වසයෙන් දුටු සත්තු ද, ඈත සිටි හෙයින් නුදුටු සත්තු ද, දුරත්, ළඟත් වසන සත්තු ද, ඉපදීම අවසන් කළ සත්වයෝ ද, ඉපදිමින් සිටින සත්වයෝ ද, යන මේ සියලු සත්වයෝ සුඛිත වෙත්වා'යි ද, මෙත් වඩන්නේය.

න පරො පරං නිකුබ්බෙථ
නාතිමඤ්ඤෙථ කත්ථචි නං
කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස
දුක්ඛමිච්ඡෙය්‍ය

එකෙක් අනෙකෙකු නො රවටන්නේ ය. අනිකෙකුට අවමන් නො

කරන්නේය. කය හා වචනය පිළිබඳ විකෘතියෙන් ද, මනෝවිකාරයෙන් ද එකෙක් අනෙකකුට දුකක් නො කැමති වන්නේ ය.

මාතා යථා නියං පුත්තං
ආයුසා එකපුත්තමනුරක්ඛෙ
එවං'පි සබ්බභූතෙසු
මානසං භාවයෙ අපරිමාණං

මව යම් සේ තමාගේ එකම පුතා ජීවිත පරිත්‍යාග යෙන් වුවත් රක්නේ ද, එපරිද්දෙන් ම සියලු සත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සහගත සිත වඩන්නේය.

මෙත්තං ච සබ්බලොකස්මිං

මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියඤ්ච
අසම්බාධං අවෙරං අසපත්තං

උඩ ද යට ද සරස ද සීමාවකුදු
නැතිව අතරතුරවත් වෛර
චේතනා පහළවීමක් නැතිව
සතුරන් රහිතව සියලු ලෝක
සත්වයා කෙරෙහි අප්‍රමාණ වූ
මෛත්‍රී සහගත සිත වඩන්නේ ය.

තිට්ඨං චරං නිසින්නො වා
සයානො වා යාවත’ස්ස
විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්ම’මෙතං විහාරං ඉධමාහු

සිටින්නේ හෝ ඇවිදින්නේ හෝ උන්නේ හෝ නිදන්නේ හෝ යම්තාක් මෛත්‍රී සහගත සිහිය වඩනු කැමැත්තේ ද, ඒ තාක් පහවූ මිද්ධය අලස බව ඇතිව අධිෂ්ඨාන කරන්නේ ය. මෛත්‍රී විහරණය මේ බුද්ධ ශාසනයෙහි ශ්‍රේෂ්ඨ විහරණයෙකැයි ප්‍රකාශ කළහ.

දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං
න හි ජාතු ගබ්භසෙය්‍යං
පුනරෙතී'ති

මිත්‍ථ්‍යා දෘෂ්ඨියට නො පැමිණ සිල්වත් වූයේ වස්තු කාමයන්

හි ගිප්‍ර බව දුරුකොට
ඒකාන්තයෙන් ම
නැවත ගර්භයෙක් හි විසීමට නො
පැමිණෙන්නේ ය. (ශුද්ධාවාසයක)
ඉපිද එහිදීම රහත් බවට පැමිණ
පිරිනිවන් පාන්නේ ය.

එතේන සච්ච වජ්ජේන සොත්ථි
තෙ හොතු සබ්බදා

ඒ සත්‍යයේ බලයෙන් සැමදා
සාමය ඔබ සමග වේවා.

(තෙවරක් කියන්න.)

ජිනපඤ්ජරය

ජයාසනගතා වීරා
ජෙත්වා මාරං සවාහිණිං
චතුසච්චාමතරසං
යෙ පිවිංසු නරාසභා

ජය අසුන් අරා වැඩ හිඳ සේනා
සහිත මරසෙන් පරදවා සිවුසස්
අමා රසය පානය කොට වදාළ

තණ්හංකරාදයෝ බුද්ධා
අට්ඨවීසති නායකා
සබ්බේ පතිට්ඨිතා තුය්හං
මත්ථකෙ තේ මුනිස්සරා

ලෝක නායක මුනීශ්වර
වූ තණ්හංකරාදි යම් අටවිසි
බුදුවරුු වෙත් ද, උන්වහන්සේලා
(ඔබේ) මස්තකයෙහි (හිස මත)
වැඩ වසන සේක.

සිරෙ පතිට්ඨිතා බුද්ධා
ධම්මෝච තව ලෝචනේ
සංඝෝ පතිට්ඨිතෝ තුය්හං
උරේ සබ්බගුණාකරෝ

(ඔබේ)සිරසෙහි බුදුවරුු වැඩ
වෙසෙති. දෑසෙහි ධර්මය පිහිටියේ
ය. ළයෙහි සියලු ගුණයට
ආකරයක් වූ මහ සඟරුවන
වෙසෙයි.

හදයෙ අනුරුද්ධෝ ච
සාරිපුත්තෝ ච දක්ඛිණෝ
කොණ්ඩඤ්ඤො පිට්ඨිභාගස්මිං
මොග්ගල්ලානෝසි වාමකෙ

(ඔබේ)හදවතේ අනුරුද්ධ තෙරුණුවෝ ද, දකුණුපස සැරියුත් තෙරුණුවෝ ද, පසුභාගයෙහි කොණ්ඩඤ්ඤ තෙරුණුවෝ ද, වම්පස මුගලන් තෙරුණුවෝ ද වෙති.

දක්ඛිණෝ සවණෝ තුය්හං
ආහුං ආනන්ද රාහුලා
කස්සපෝ ච මහානාමෝ
උභෝසුං වාමසෝතකේ

දකුණු කණෙහි ආනන්ද, රාහුල තෙරවරු ද, වම් කණෙහි කාශ්‍යප, මහානාම තෙරුන් වහන්සේලා ද වසන සේක.

කේසන්තේ පිට්ඨිභාගස්මිං
සූරියෝ විය පභංකරෝ
නිසින්නෝ සිරිසම්පන්නෝ
සෝභිතෝ මුනිපුංගවෝ

කේශාන්තයේ සහ පසුභාගයෙහි සමෘද්ධි සම්පන්නව හිරුමෙන් බබළන සෝභිත නම් මුනි උතුමාණෝ පිහිටිය හ.

කුමාරකස්සපෝ නාම
මහේසී චිත්‍රවාදකෝ

සෝ තුය්හං වදනේ නිච්චං
පතිට්ඨාසි ගුණාකරෝ

විචිත්‍ර කථිකයන් අතුරෙන් අගතැන්පත් ගුණයන්ට ආකර වූ, කුමාර කාශ්‍යප නම් මහා සෘෂින් වහන්සේ මුහුනෙහි නිතර පිහිටි සේක.

පුණ්ණෝ අංගුලිමාලෝ ච
උපාලි නන්ද සීවලි
ථෙරා පඤ්ච ඉමේ ජාතා
ලලාටේ තිලකා තව

පුණ්ණ, අංගුලිමාල, උපාලි, නන්ද, සීවලී, යන පස්තෙරුන්

වහන්සේලා ඔබේ
නලලෙහි තිලකයක් මෙන් වසන
සේක.

සේසාසීති මහාථේරා
විජිතා ජිනසාවකා
ජලන්තා සීලතේජේන
අංගමංගේසු සන්ඨිතා

කෙලෙස් සතුරන් පරදවා ජයලද,
සිල් තෙදින් බබලන බුදු සව් සෙසු
අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා
ඔබේ අඟපසගෙහි පිහිටියාහු ය.

රතනං පුරතෝ ආසි
දක්ඛිණේ මෙත්තසුත්තකං

ධජග්ගං පච්ඡතෝ ආසි
වාමේ අංගුලිමාලකං

ඔබේ පෙරටුවේ රතන සූත්‍රය පිහිටියේ ය. දකුණේ මෙත්ත සූත්‍රය ද, පසුභාගයෙහි ධජග්ග සූත්‍රය ද, වම් පස අංගුලිමාල සූත්‍රය ද පිහිටියේ ය.

ඛන්ධ මෝර පරිත්තං ච
ආටානාටිය සුත්තකං
ආකාසච්ඡදනං ආසි
සේසා පාකාරසණ්ඨිතා

කඳ පිරිත, මෝර පිරිත, ආටානාටිය සූත්‍රය ඔබට අහසෙහි

සෙවනක් මෙන් ද, සෙසු සියලු පිරිත් ඔබ අවට ප්‍රාකාර මෙන් ද පිහිටියාහු ය.

ජිනා'ණාබල සංයුත්තේ
ධම්මපාකාර'ලංකතේ
වසතෝ තේ චතුකිච්චේන
සදා සම්බුද්ධපඤ්ජරේ

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අණ බෙලෙන් යුතු ධර්‍මය නමැති ප්‍රාකාරයෙන් අලංකාර වූ සර්‍වඥ නමැති ජිනපඤ්ජරයෙහි (බුදුමැදුරෙහි) හැම කල්හි සිවු ඉරියව්වෙන් වෙසෙන

වාතපිත්තාදිසඤ්ජාතා
බාහිරජ්ඣත්තු'පද්දවා
අසේසා විලයං යන්තු
අනන්තගුණ තේජසා

ඔබට වා පිත් ආදියෙන්
හට ගන්නා වූ ද ආධ්‍යාත්මක
බාහිරවූ ද සියලු උවදුරු
අනන්ත ගුණ තෙදින්
සර්වප්‍රාකාරයෙන් දූරීභූත වේවා.

ජිනපඤ්ජර මජ්ඣට්ඨං
විහරන්තං මහීතලේ
සදා පාලෙන්තු ත්වං සබ්බේ
තේ මහාපුරිසා'සභා

ජිනපඤ්ජර මධ්‍යගතව
පොළෝ තලයෙහි වාසය කරණ
ඔබ ඒ සියලු පුරුෂෝත්තමයන්
වහන්සේලා හැම කල්හි ම
ආරක්ෂා කෙරෙත්වා.

ඉච්චේව මච්චන්ත කතෝ
සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතූපපද්දවෝ
බුද්ධානුභාවේන හතාරිසංඝෝ
චරාමි සද්ධම්මනුභාවපාලිතෝ

මෙසේ ඒකාන්තයෙන් කරණ ලද
ආරක්ෂා ඇතිව ජිනේන්ද්‍රයන්
වහන්සේ ගේ ආනුභාවයෙන්
දිනන ලද උවදුරු ඇතුව
බුද්ධානුභාවයෙන් නසන ලද

සතුරු සමූහයා ඇතිව සදහම්
බෙලෙන් ආරක්‍ෂා කරන ලදුව
හැසිරෙන්නේ ය.

ඉච්චේව මච්චන්තකතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතූපපද්දවෝ
ධම්මානුභාවේන හතාරිසංඝෝ
චරාහි සද්ධම්මනුභාවපාලිතෝ

මෙසේ ඒකාන්තයෙන් කරණ ලද
ආරක්‍ෂා ඇතිව ජිනේන්ද්‍රයන්
වහන්සේ ගේ ආනුභාවයෙන්
දිනන ලද උවදුරු ඇතුව
ධම්මානුභාවයෙන් නසන ලද
සතුරු සමූහයා ඇතිව සදහම්
බෙලෙන් ආරක්‍ෂා කරන ලදුව
හැසිරෙන්නේ ය.

ඉච්චේව මච්චන්තකතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතූපපද්දවෝ
සංඝානුභාවේන හතාරිසංඝෝ
චරාහි සද්ධම්මනුභාවපාලිතෝ

මෙසේ ඒකාන්තයෙන් කරණ ලද ආරක්ෂා ඇතිව ජිනේන්ද්‍රයන් වහන්සේ ගේ ආනුභාවයෙන් දිනන ලද උවදුරු ඇතුව සංඝානුභාවයෙන් නසන ලද සතුරු සමූහයා ඇතිව සදහම් බෙලෙන් ආරක්ෂා කරන ලදුව හැසිරෙන්නේ ය.

සද්ධම්මපාකාරපරික්ඛිතෝසි
අට්ඨා’රියා අට්ඨදිසාසු හොන්ති
එත්ථන්තරේ අට්ඨනාථා භවන්ති

උද්ධං විතානං ච ජිනා ඨිතා තේ

ඔබ සද්ධර්මීය නමැති ප්‍රාකාරයෙන් වට කරන ලද්දේ වේ. ආයර්‍යයන් වහන්සේලා අට නම අට දිශාවන්හි වෙති. මේ අතරෙහි අට බුදුවරු වෙති. ඔබට උඩුවියනක් සේ සියලු බුදුවරු වෙසෙති.

භින්දන්තෝ මාරසේනං තව සිරසි ඨිතෝ බෝධිමාරුය්හ සත්‍ථා මොග්ගල්ලානෝසි වාමේ වසති භුජතටේ දක්ඛිණේ සාරිපුත්තෝ ධම්මෝ මජ්ඣේ උරස්මිං විරහති භවතෝ-මොක්ඛතෝ මෝරයෝනිං

සම්පත්තෝ බෝධිසත්තෝ චරණ යුගගතෝ භානුලෝකේකනාථෝ

හිරුමෙන් ලෝවැසියාට අසහාය සරණ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ජයසිරි මහ බෝ රුක්මුල විදුරසුන් අරා වැඩහිඳ, දස මරසෙන් පරදවමින් (බිඳිමින්) ඔබගේ සිරසෙහි සිටි සේක. මහ මුගලන් තෙරුන් වහන්සේ වම් පසෙහි ද, සැරියුත් මහ තෙරුන් වහන්සේ දකුණු පසෙහි ද, වසති. භවයෙන් මිදීම හේතුකොට ගෙන ධර්මීය ලය මැද පවතී. මෝරයෝනියට පැමිණියා වූ බෝසතාණන් වහන්සේ පා යුවලට ගිය සේක.

සබ්බාවමඞගලමුපද්දව
දුන්නිමිත්තං
සබ්බීතිරෝග ගහදෝසමසේස
නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං
අකන්තං
බුද්ධානුභාව පවරේන පයාතු
නාසං

සියලු අවමඟුල්, උවදුරු, නපුරු නිමිති, රෝග, පීඩා, ග්‍රහදෝෂ, නින්දා, ගර්හා, භය, නපුරු සිහින, යන මේ සියල්ල බුද්ධ රත්නයේ ආනුභාවයෙන් දුරුවෙත්වා.

සබ්බාවමඞගලමුපද්දව
දුන්නිමිත්තං
සබ්බීතිරෝග ගහදෝසමසේස
නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං
අකන්තං
ධම්මානුභාව පවරේන පයාතු
නාසං

සියලු අවමඟුල්, උවදුරු, නපුරු නිමිති, රෝග, පීඩා, ග්‍රහදෝෂ, නින්දා, ගර්හා, භය, නපුරු සිහින, යන මේ සියල්ල ධම්ම රත්නයේ ආනුභාවයෙන් දුරුවෙත්වා.

සබ්බාවමඞගලමුපද්දව
දුන්නිමිත්තං
සබ්බීතිරෝග ගහදෝසමසේස
නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං
අකන්තං
සංඝානුභාව පවරේන පයාතු
නාසං

සියලු අවමඟුල්, උවදුරු, නපුරු නිමිති, රෝග, පීඩා, ග්‍රහදෝෂ, නින්දා, ගර්හා, භය, නපුරු සිහින, යන මේ සියල්ල සංඝ රත්නයේ ආනුභාවයෙන් දුරුවෙත්වා.

ඇණවුම් පිරිත

**යෙ සන්තා සන්ත චිත්තා තිසරණ සරණා එත්ථ ලොකන්තරේ වා -
භුම්මා භුම්මා ච
දෙවා ගුණගණගහණබ්‍යාවටා
සබ්බකාලං,
ඒතෙ ආයන්තු දේවා
වරකනකමයේ මේරුරාජේ
වසන්තෝ සන්තො සන්තො
සහේතුං මුනිවර වචනං
සොතුමග්ගං සමග්ගං.**

පිවිතුරු සිත් ඇත්තාවූ ද, සියලු ගුණ දහමින් බබළවන්නාවූ ද, මෙලොව සහ අන් සියලු ලොව

වසන්නාවූ ද, සකල විධ දෙවිවරුන් සපැමිණ සියලු සත හට සදාකාලික සුව සහනය ගෙන දෙන උතුම් නිවන් මගට යොමු වීම උදෙසා, මුණිවරයන් විසින් දෙසූ බුදුබණ සතුටු සිතින් අසත්වා.

සබ්බේසු චක්කවාළේසු,
යක්ඛා දේවා ච බ්‍රහ්මුනෝ
යං අම්හේහි කතං පුඤ්ඤං,
සබ්බසම්පත්තිසාධකං,
සබ්බේ තං අනුමෝදිත්වා,
සමග්ගා සාසනේ රතා,
පමාදරහිතා හොන්තු,
ආරක්ඛා සුවිසේසතෝ

මුළු සක්වල වසන්නා වූ සියළු යක්‍ෂ, දේව, බ්‍රහ්ම, ආදීන් අප විසින් අනුමෝදන් කරන්නට යෙදුන සියළු පින් අනුමෝදන් වීමෙන් සමගිව සසුනට ඇල්මෙන් වෙසෙත්වා, සදාකල්හිම ර්‍ැකවරණය ලබත්වා.

සාසනස්ස ච ලෝකස්ස, වුද්ධි භවතු සබ්බදා සාසනම්පි ච ලෝකඤ්ච, දේවා රක්ඛන්තු සබ්බදා,
සද්ධිං හොන්තු සුඛී සබ්බේ, පරිවාරේහි අත්තනෝ,
අනීඝා සුමනා හොන්තු සහ සබ්බේහි ඤාතිභී

සියළු දෙව් දේවතාවුන් තම
සපිරිවර සමගින් සුවපත් වේවා.
සියළු දෙවියෝ ද, ඥාතීහු ද,
සදාකල්හී මෙම සසුනෙහි
හිතැත්තෝ වෙත්වා.
අභිවෘද්ධිය සහ දියුණුව
සලසත්වා. මෙම නිර්මල සසුන
රකිත්වා.

රාජතෝ වා චෝරතෝ වා
මනුස්සතෝ වා
අමනුස්සතෝ වා අග්ගිතෝ වා
උදකතෝ වා පිසාචතෝ වා
ඛාණුකතෝ වා කණ්ඨකතෝ වා
නක්ඛත්තතෝ වා ජනපදරෝගතෝ
වා අසද්ධම්මතෝ වා

අසන්දිට්ඨිතෝ වා අසප්පුරිසතෝ වා

රජුන්ගෙන් ද, සොර සතුරන්ගෙන් ද, මිනිස් නොමිනිස් සතුන්ගෙන් ද, ගින්නෙන් ද, ජලයෙන් ද, භූතයන්ගෙන් ද, කටුක ග්‍රහ දෝෂයන්ගෙන් ද, රෝගයන්ගෙන් ද, අසත්පුරුෂයන්ගෙන් ද, වැරදි දැක්මෙන් සහ දුදනන්ගෙන් ද,

චණ්ඩහත්ථි - අස්ස මිග ගෝණ කුක්කුර අහිවිච්ඡික මණිසප්පදීපි අච්ඡතරච්ඡ සූකර - මහිස යක්ඛරක්ඛසාදීහි නානාභයතෝ වා නානාරෝගතෝ වා

නානාඋපද්දවතෝ වා
ආරක්ඛං ගණ්හන්තු.

ඇතුන්, අශ්වයින්, මුවන්,
ගෝණුන්, සුනඛයින්, සර්පයින්,
ගෝණුස්සන්, ආදී අධික විස
සතුන්ගෙන් ද, තවද දිවියන්,
කොටින්, ගවයන්, වලසුන්, උරන්,
මී ගවයන්, ආදී සතුන්ගෙන් ද,
දරුණු වූ යකුන්, රකුසන්,
ආදීන්ගෙන් ද, පැමිණෙන
නොයෙක් බිය, නොයෙක් රෝග,
අනේක වූ උවදුරු වළක්වා
මනාලෙස රැකවරණය සලසා,
සියළු ම සතුන් වෙත සෙත්
ශාන්තිය උදාකරත්වා, සියළු
සතුන් රැකදෙත්වා.

අටවිසි පිරිත

තණ්හංකරෝ මහාවීරෝ
මේධංකරෝ මහායසෝ
සරණංකරෝ ලෝකහිතෝ
දීපංකරෝ ජුතින්ධරෝ

මහාවීර වූ තණ්හංකර
බුදුරජාණන් වහන්සේ ද,
මහා යසස් ඇත්තා වූ මේධංකර
බුදුරජාණන් වහන්සේ ද, ලෝකයට
හිතවත් වූ සරණංකර බුදුරජාණන්
වහන්සේ ද, මහත් ආලෝකයක්
දෙන්නා වූ දීපංකර බුදුරජාණන්
වහන්සේ ද,

කොණ්ඩඤ්ඤෝ ජනපාමොක්ඛෝ
මංගලෝ පුරිසාසභෝ
සුමනෝ සුමනෝ ධීරෝ
රේවතෝ රතිවද්ධනෝ

මනුෂ්‍යයන්ට නිවන දෙන්නාවූ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ ද, මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ වූ මංගල බුදුරජාණන් වහන්සේ ද, සතුටු මනසක් ඇති සුමන බුදුරජාණන් වහන්සේ ද, නිවනට සිත යොමුකළ රේවත බුදුරජාණන් වහන්සේ ද,

සෝභිතෝ ගුණසම්පන්නෝ

අනෝමදස්සී ජනුත්තමෝ
පදුමෝ ලෝකපජ්ජෝතෝ
නාරදෝ වරසාරථී

ගුණ සම්පන්න වූ සෝභිත බුදුරජාණන් වහන්සේ ද, ජනයා අතර උතුම් වූ අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ ද, ලෝකයට දැල්වූ පහනක් බඳු වූ පදුම බුදුරජාණන් වහන්සේ ද, ලෝකයට උතුම් වූ මග පෙන්නන්නා වූ නාරද බුදුරජාණන් වහන්සේ ද,

පදුමුත්තරෝ සත්තසාරෝ
සුමේධෝ අග්ගපුග්ගලෝ
සුජාතෝ සබ්බලෝකග්ගෝ

පියදස්සී නරාසභෝ

සත්වයන්ට නිවන පෙන්නන්නා වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ද, මිනිසුන් අතර අග්‍ර වූ සුමේධ බුදුරජාණන් වහන්සේ ද, ලෝකයාට උතුම් වූ සුජාත බුදුරජාණන් වහන්සේ ද, මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ වූ පියදස්සී බුදුරජාණන් වහන්සේ ද,

අත්ථදස්සී කාරුණිකෝ
ධම්මදස්සී තමෝනුදෝ
සිද්ධත්ථෝ අසමෝ ලෝකේ
තිස්සෝ වරදසංවරෝ

කරුණා ගුණ ඇති අත්ථදස්සී
බුදුරජාණන් වහන්සේ ද, අඳුර
දුරු කළා වූ ධම්මදස්සී
බුදුරජාණන් වහන්සේ ද,
ලෝකයාට අසම සම වූ සිද්ධත්ථ
බුදුරජාණන් වහන්සේ ද, සංවර
බවින් උතුම් වූ තිස්ස බුදුරජාණන්
වහන්සේ ද,

ඵුස්සෝ වරදසම්බුද්ධෝ
විපස්සීච අනූපමෝ
සිඛී සබ්බහිතෝ සත්ථා
වෙස්සභූ සුඛදායකෝ

සම්බුදු බවින් උතුම් වූ ඵුස්ස
බුදුරජාණන් වහන්සේ ද, උපමා
නොමැත්තා වූ විපස්සී

බුදුරජාණන් වහන්සේ ද, සියලු සත්වයින්ට හිත් ඇත්තා වූ සිඛී බුදුරජාණන් වහන්සේ ද, සැප ගෙනදෙන්නා වූ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ ද,

කකුසන්ධෝ සත්ථවාහෝ
කෝණාගමනෝ රණඤ්ජහෝ
කස්සපෝ සිරිසම්පන්නෝ
ගෝතමෝ සක්‍යපුංගවෝ

සත්වයන්ට මඟ පෙන්නන්නාවූ කකුසඳ බුදුරජාණන් වහන්සේ ද, මාර යුද්ධයෙන් ජයගත්තාවූ කෝණාගමන බුදුරජාණන් වහන්සේ ද, යහපත් ගුණයෙන් යුක්ත වූ කස්සප බුදුරජාණන්

වහන්සේ ද, ශාක්‍ය වංශයට
උතුම් වූ ගෞතම බුදුරජාණන්
වහන්සේ ද,

තේසං සච්චේන සීලේන
ඛන්ති මෙත්ත බලේන ච
තේපි තං අනුරක්ඛන්තු
ආරෝග්‍යෙන සුඛේන චාති

ඒ බුදුරජාණන් වහන්සේලාගේ
සත්‍ය බලයෙන්, ශීල බලයෙන්,
ශාන්ති බලයෙන්, මෛත්‍රී බලයෙන්,
නීරෝගීව, සැපයෙන් යුතුව ඔබ
සැම ආරක්ෂා වේවා.

අට්ඨ වීසති මේ බුද්ධා
පූරෙත්වා දසපාරමී

ජේත්වා මාරාරිසංගාමං
බුද්ධත්තං සමුපාගමුං
ඒතේන සච්ච වජ්ජේන
හෝතු තේ ජයමංගලං

මෙම බුදුවරුන් විසි අට දෙනා වහන්සේලා, දස පාරමිතාවෝ සම්පූර්ණ කර බුද්ධත්වයට පත් වූ සේක. ඒ සත්‍යයේ බලයෙන් ඔබට ජය මංගලයක් වේවා.

මහා ජයමංගල ගාථා

මහාකාරුණිකො නාථො
හිතාය සබ්බපාණිනං
පූරෙත්වා පාරමී සබ්බා
පත්තො සම්බොධි මුත්තමං
ඒතේන සච්ච වජ්ජේන
හෝතු තෙ ජයමංගලං

සියළු සතුනට හිතැතිවූ මහා කාරුණිකයාණන් වහන්සේ, පාරමී දම් පුරා, උතුම් බුද්ධත්වය ලබා ගත් සේක. මේ සත්‍යයේ වචනයෙන් අප සැමට ජය මංගල්‍යයක් වේවා. අපට ද

නියත ජය ලැබේවා. අපට ද ජය මංගලයයක් ම වේවා.

ජයන්තො බොධියා මූලේ
සක්‍යානං නන්දි වඩ්ඪනො
ඒවං තුය්හං ජයො හෝතු
ජයස්සු ජයමංගලං

සියළු සතුන් ගේ සිත් සතන් සනසමින් අප මහා බෝසතාණෝ ශ්‍රී මහා බෝ සමිඳු පා මුල මාර සේනා ජයගත් සේක.

සක්කත්වා බුද්ධ රතනං
ඕසධං උත්තමං වරං
හිතං දේවමනුස්සානං

බුද්ධ තේජේන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බේ
දුක්ඛා වූපසමෙන්තු තෙ

සියළු දෙව් මිනිසුන්ගේ හිත සුව සහනය පිණිස වූ ඖෂධයකට සම වූ, බුදුවරුන්ගේ බුද්ධ ගුණයෙන් අප සැමගේ සියළු දුක් නැසේවා. සියළු දුක් දුරු වේවා.

සක්කත්වා ධම්ම රතනං
ඕසධං උත්තමං වරං
පරිළාහූපසමනං
ධම්මතේජේන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බේ
භයා වූපසමෙන්තු තෙ

සියළු දුක් වේදනා සංසිදුවන
උතුම් වූ ඖෂධයකට සම වූ,
සම්මා සම්බුදු දහමේ බලයෙන්
අප සැමගේ ඇතිවන සියළු භය
නැසේවා. සියළු බිය දුරුවේවා.

සක්කත්වා සංඝ රතනං
ඕසධං උත්තමං වරං
ආහුනෙය්‍යං පාහුනෙය්‍යං
සංඝ තේජේන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බේ
රොගාවූපසමෙන්තු තෙ

පින් කෙතක් බඳු වූ උතුම් වූ
ඖෂධයකට සමවන දුර සිට ගෙන
එනු ලබන දහම් පඬුරු, දන්

පිළිගැනීමට සුදුසු වූ මහා
සංඝරත්නයේ බලයෙන් අප
සැමගේ ඇති වන සියළු රෝග
උවදුරු නැසේවා.

යං කිඤ්චි රතනං ලොකේ
විජ්ජති විවිධා පුථු
රතනං බුද්ධ සමං නත්ථි
තස්මා සොත්ථි භවන්තු තෙ

ලොවේ ඇති අනේක වූ රුවන්
අතරින් බුදුරුවනට සම වෙනත්
රුවනක් නැත්තේමය. ඒ
බුදුරුවනේ බලයෙන් අපහට සුව
සෙත ලැබේවා.

යං කිඤ්චි රතනං ලොකේ

විජ්ජති විවිධා පුථු
රතනං ධම්ම සමං නත්ථි
තස්මා සොත්ථි භවන්තු තෙ

ලොවේ ඇති අනේක වූ රුවන් අතරින් දම් රුවනට සම වෙනත් රුවනක් නැත්තේමය. ඒ දම්රුවනේ බලයෙන් අපහට සුව සෙත ලැබේවා.

යං කිඤ්චි රතනං ලොකේ
විජ්ජති විවිධා පුථු
රතනං සංඝ සමං නත්ථි
තස්මා සොත්ථි භවන්තු තෙ

ලොවේ ඇති අනේක වූ රුවන්
අතරින් සඟ රුවනට සම වෙනත්
රුවනක් නැත්තේමය. ඒ
සඟරුවනේ බලයෙන් අපහට
සුව සෙත ලැබේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං
බුද්ධො මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන
හෝතු තෙ ජයමංගලං

මා හට බුදුසරණ මිස අන්
සරණක් නොමැත. මේ සැබෑ
වදනින් අප සැමට ජය
මංගල්‍යයක් වේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං

ධම්මො මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන
හෝතු තෙ ජයමංගලං

මා හට දහම් සරණ මිස අන්
සරණක් නොමැත. මේ සැබෑ
වදනින් අප සැමට ජය
මංගල්‍යයක් වේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං
සංඝො මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන
හෝතු තෙ ජයමංගලං

මා හට සඟ සරණ මිස අන්
සරණක් නොමැත. මේ සැබෑ

වදනින් අප සැමට ජය මංගල්‍යයක් වේවා. සියළු උවදුරු දුරුවේවා.

සබ්බීතියො විවජ්ජන්තු
සබ්බරොගො විනස්සතු
මා තෙ භවත්වන්තරායො
සුඛී දීඝායුකො භව

සියළු රෝග නැති වේවා. කිසිදු ආන්ත්‍රායක් නොමවේවා. දීර්ඝා'යුෂ ලැබේවා.

භවතු සබ්බමංගලං
රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානුභාවේන

සදා සොත්ථි භවන්තු තෙ

සියළු බුදු බලයෙන් සියළු දෙවියෝ රැක දෙත්වත්වා. ඒ සියළු බලයෙන් අපට සදා සුවසෙත අත්වේවා.

භවතු සබ්බමංගලං
රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානුභාවේන
සදා සොත්ථි භවන්තු තෙ

සියළු දහම් බලයෙන් සියළු දෙවියෝ රැක දෙත්වා. ඒ සියළු බලයෙන් අපට සදා සුවසෙත අත්වේවා.

භවතු සබ්බමංගලං
රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානුභාවේන
සදා සොත්ථි භවන්තු තෙ

සියළු සඟ බලයෙන් සියළු
දෙවියෝ රැක දෙත්වා. ඒ සියළු
බලයෙන් අපට සදා සුවසෙත
අත්වේවා.

නක්ඛත්ත යක්ඛභූතානං
පාපග්ගහනිවාරණා
පරිත්තස්සානුභාවේන
හන්තු තේසං උපද්දවේ

නැකැත් වලින්, ග්‍රහ අපල වලින්, සිදුවන සියළු උවදුරු මේ පිරිතේ අනුහසින් දුරුවේවා. සියළු බුදුවරුන්ගේ බලයෙන්, සියළු පසේ බුදුවරුන්ගේ ශක්තියෙන්, සියළු රහතුන් වහන්සේලාගේ තේජසින්, ඔබ සැම ආරක්‍ෂා වේවා.

ජය පිරිත

සිරි ධිති මති තෙජෝ ජය සිද්ධි මහිද්ධි මහා ගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස භගවතෝ අරහතො සම්මාසම්බුද්ධස්ස

සෞභාග්‍යයෙන් ද, ධෛර්යයෙන් ද, නුවණින් හා තේජසින් ද, උප ලක්ෂිත මහා ඍද්ධිමත් වූ, මහා ගුණයෙන් හා අප්‍රමාණ වූ, පුඤ්ඤමහිමයෙන් යුක්ත වූ, අනතුරු වැළැක්මෙහි සමත් වූ, භාග්‍යවත් අරහත් සම්බුදු රජාණන් වහන්සේගේ

ද්වත්තිංසමහා පුරිස
ලක්ඛණානුභාවෙන
අසීත්‍යනුබ්‍යඤ්ජන
ලක්ඛණානුභාවෙන
අට්ඨුත්තරසතමංගල
ලක්ඛණානුභාවෙන
ඡබ්බණ්ණරංස්‍යානුභාවෙන
කේතුමාලානුභාවෙන
දසපාරමිතානුභාවෙන
දසඋපපාරමිතානුභාවෙන
දසපරමත්ථපාරමිතානුභාවෙන
සීලසමාධිපඤ්ඤානුභාවෙන
බුද්ධානුභාවෙන ධම්මානුභාවෙන
සංඝානුභාවෙන තේජානුභාවෙන
ඉද්ධියානුභාවෙන බලානුභාවෙන

ඤෙය්‍යධම්මානුභාවෙන
චතුරාසීතිසහස්ස
ධම්මක්ඛන්ධානුභාවෙන
නවලෝකොත්තර ධම්මානුභාවෙන
අට්ඨංගිකමග්ගානු භාවෙන
අට්ඨසමාපත්‍යානුභාවෙන
ඡළභිඤ්ඤානුභාවෙන
මෙත්තා කරුණා මුදිතා
උපෙක්ඛානු භාවෙන
සබ්බ පාරමිතානුභාවෙන
රතනත්තය
සරණානුභාවෙන තුයිහං
සබ්බරෝග සොකඋපද්දව
දුක්ඛදෝමනස්සුපායාසා
විනස්සන්තු සබ්බසංකප්පා

තුයිහං සම්ජ්ජන්තු දීඝායුකෝ හෝතු සතවස්සජීවේන සමංගිකෝ හෝතු සබ්බදා

දෙතිස් මහා පුරුෂලක්ඛණානුභාවයෙන් ද, අසූවක් අනුකුඩා ලකුණුවල ආනුභාවයෙන් ද, සවනක් රැස් ආනුභාවයෙන් ද, කේතුමාලානුභාවයෙන් ද, දසපාරමිතානුභාවයෙන් ද, දසඋපපාරමිතානුභාවයෙන් ද, දසපරමත්ථපාරමිතානුභාවයෙන් ද, සීල සමාධි පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවන්ගේ ආනුභාවනයෙන් ද,

බුද්ධ ධම්ම සංඝ යන තෙරුවන් ගේ ආනුභාවයෙන් ද, තේජසින් සෘද්ධියෙන් බලයෙන් දතයුතු දේ දැන වදාරණ ලද්දා වූ, ආනුභාවයෙන් ද, අසූහාරදහසක් ධර්මස්කන්ධයේ ආනුභාවයෙන් ද, නව ලොවුතුරු දහමේ ආනුභාවයෙන් ද, ආර්‍ය්‍යඅෂ්ඨාංගික මාර්ගයේ ආනුභාවයෙන් ද, අෂ්ඨසමාපත්‍යාණුභාවයෙන් ද, සය අභිඥද්ඥදාවන්ගේ ආනුභාවයෙන් ද, මෙත්තා කරුණා මුදිතා උපෙක්ෂා යන සිවු බඹ විහරණයන්ගේ ආනුභාවයෙන් ද, සියළු පාරමිතාවන්ගේ

ආනුභාවයෙන් ද, තෙරුවන්ගේ ආනුභාවයෙන් ද, ඔබගේ සියළු රෝග ශෝක දුරු වේවා. කරදර දුක් දොම්නස් සිත් වේදනා වැනසේවා. ඔබගේ සියළු කල්පනාවන් ඉටු වේවා. සියක් වසක් කල් ජීවත් වීමට ශක්තිය ලැබේවා.

ආකාස පබ්බත වන
භූමි තටාක ගංගා මහා සමුද්ද
ආරක්ඛක දේවතා සදා තුම්හෙ
අනුරක්ඛන්තු
සබ්බබුද්ධානුභාවෙන
සබ්බධම්මානුභාවෙන

සබ්බසංඝානුභාවෙන බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං තිණ්ණං රතනානං ආනුභාවෙන චතුරාසීතිසහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන පිටකත්තයානුභාවෙන ජිනසාවකානුභාවෙන සබ්බේ තෙ රෝගා සබ්බේ තෙ භයා සබ්බේ තෙ අන්තරායා සබ්බේ තෙ උපද්දවා සබ්බේ තෙ දුන්නිමිත්තා සබ්බේ තෙ අවමංගලා විනස්සන්තු

සියළු කල්හි, අහස, පර්වත, වන බිම්, තටාක, ගංගා හා මහසයුර,

අරක්ගත් දෙවියෝ ඔබගේ රැකවරණය සලසත්වා. සියළු බුදුවරුන්ගේ, සියළු ධර්මයේ, සියළු සංඝයාගේ ආනුභාවයෙන්, බුද්ධ ධම්ම හා සංඝ යන තෙරුවන්ගේ ආනුභාවයෙන්, අසූහාරදහසක් ධර්මස්කන්ධයේ ආනුභාවයෙන්, ත්‍රිපිටකයේ ආනුභාවයෙන්, බුද්ධශ්‍රාවකයානණ් වහන්සේලාගේ ආනුභාවයෙන්, ඔබගේ සියළු රෝග, සියළු භය, සියළු අනතුරු, සියළු කරදර, සියළු අශුභ නිමිති, සියළු සිත් නොපිනවන දේ වැනසේවා, දුරුවේවා.

ආයුවඩ්ඪකො ධනවඩ්ඪකො
සිරිවඩ්ඪකො යසවඩ්ඪකො
බලවඩ්ඪකො වණ්ණවඩ්ඪකො
සුඛවඩ්ඪකො හෝතු සබ්බදා

සියළු කල්හි, ආයුෂෙන්, ධනයෙන්, යසසෙන්, බලයෙන් ද, වර්ණයෙන් හා සැපයෙන් වර්ධනය වේවා.

දුක්ඛ රොග භයා වෙරා සොකා
සබ්බෙ උපද්දවා අනෙකා
අන්තරායාපි විනස්සන්තු ච
තෙජසා ජයසිද්ධි ධනං ලාභං
සොත්ථි භාග්‍යං සුඛං බලං සිරි

ආයු ච වණ්ණෝච භෝගංවුද්ධි ච යසවා සතවස්සා ච ආයූ ච ජීව සිද්ධි භවන්තු තෙ

දුක් රෝග භය වෛර ශෝක ද, කරදර සමනය වේවා. නොයෙක් අනතුරු අන්තරාවන් ඒ තේජසෙන් විනාස වෙත්වා. ජයසිද්ධිය ද, ධන ලාභය ද, සුව සම්පත, වාසනාව ද, සැප බල හා ආයුෂ ද, වර්ණ සම්පත ද, භෝගයන් ගේ වර්ණය ද, කීර්තිය ද, සිය වසකට අධික කාලයක් ආයු වැඩීම ද, දේව සිද්ධිය ද, ඔබ හට ලැබේවා. සියළු උවදුරු දුරු

කෙරේවා. නසා රෝ දුක් බියකරු,
නොවේවා අනතුරක් කිසිදා,
දිනේවා ආයුෂ දිගු.

ජයමංගල ගාථා

බාහුං සහස්ස මභිනිම්මිත
සායුධං තං
ගිරිමේඛලං උදිතඝොර සසෙන
මාරං
දානාදි ධම්ම විධිනා ජිතවා
මුනින්දො
තං තෙජසා භවතු තෙ
ජයමංගලානි

මවන ලද බාහු දහසක් ඇති
ආයුධ සහිත වූ ගිරිමේඛලා ඇතු
පිට නැඟ සේනා සහිතව
පැමිණියා වූ මාරයා, මුනින්ද්‍රයන්
වහන්සේ, දානාදිධර්‍ම විධියෙන්
ජයගත් සේක. ඒ තේජසින් ඔබට
ජය මඟුල් වේවා.

**මාරාතිරෙක මභියුජ්ඣිත සබ්බ
රත්තිං
ඝොරම්පනාලවක මක්ඛ මථද්ධ
යක්ඛං
ඛන්තී සුදන්ත විධිනා ජිතවා
මුනින්දො
තං තෙජසා භවතු තෙ
ජයමංගලානි**

අතිරේක වූ මාරයකු මෙන් සියලු රැයෙහි යුද්ධයට ඉදිරිපත් වූ ඝොර නම් වූ, ගුණාමකු වූ, තද වූ, අළවූ යකු, මුනින්ද්‍රයන් වහන්සේ, ක්ෂාන්ති නම් වූ ඉතා දැමුණු විධියෙන් ජයගත් සේක. ඒ තේජසින් ඔබට ජය මඟුල් වේවා.

නාලාගිරිං ගජවරං අතිමත්ත භූතං
දාවග්ගි චක්ක මසනීව සුදාරුණං තං
මෙත්තම්බු සෙක විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමංගලානි

බොහෝ සෙයින් මත්ව,
ළැව්ගින්නක් මෙන්ද, සෙණක්
මෙන්ද, ඉතා දරුණුව ආ ඒ
නාලාගිරි නම් මහ ඇතා
මුනින්ද්‍රයන් වහන්සේ, මෙත් සිසිල්
ඉසීම නමැති විධියෙන් ජයගත්
සේක. ඒ තේජසින් ඔබට ජය
මඟුල් වේවා.

උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ
සුදාරුණං තං
ධාවං තියොජන පථං ගුලිමාල
වන්තං
ඉද්ධීභිසංඛත මනො ජිතවා
මුනින්දො
තං තෙජසා භවතු තෙ
ජයමංගලානි

ඉස්සූ කඩුවක් ඇති අතින්, ඉතා දරුණු ව තුන් යොදුන් මඟ දිවූ, ඒ අඟුල්මල් සොරු, මුනින්ද්‍රයන් වහන්සේ, සෘද්ධියෙන් උසස් ව සකස්කරන ලද මනසින් ජයගත් සේක. ඒ තේජසින් ඔබට ජය මඟුල් වේවා.

කත්වාන කට්ඨ මුදරං
ඉව ගබ්භිනීයා
චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣෙ
සන්තෙන සොම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමංගලානි

බඩෙහි දර මිටියක්
බැඳගෙන, ගැබිණියක මෙන්
ජනකාය මධ්‍යයෙහි
චිඤ්චාමානවිකාව බැණ වැදුනු
දුෂ්ඨ වූ බස්, මුනින්ද්‍රයන්
වහන්සේ, ශාන්ත වූ සෞම්‍ය
විධියෙන් ජයගත් සේක. ඒ
තේජසින් ඔබට ජය මඟුල් වේවා.

සච්චං විහාය මති සච්චක වාද කෙතුං
වාදාභිරොපිතමනං අති අන්ධභූතං
පඤ්ඤාපදීප ජලිතො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමංගලානි

සත්‍ය අතහැර වාදයෙහි ම නැගූ සිත් ඇතිව, ඉතාම අන්ධව, බාලව, ලොවෙහි ප්‍රසිද්ධ කේතු (කොඩි ඇති) හෙවත් ලොවෙහි පතළ වූ සච්චකයාගේ වාදය ප්‍රඥා ප්‍රදීපයෙන් ජවලිත වූ මුනින්ද්‍රයන් වහන්සේ, ජයගත් සේක. ඒ තේජසින් ඔබට ජය මඟුල් වේවා.

නන්දොපනන්ද භුජගං විබුධං මහිද්ධිං
පුත්තෙන ථෙර භුජගෙන දමාපයන්තො
ඉද්ධූප දෙස විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමංගලානි

වෙසෙස් නුවණින් යුතු, මහාර්ධ වූ, නන්දෝපනන්ද නම් නාගරාජයා, තමන්ගේ පුත් ස්ථවිර නාගයා ලවා හෙවත් මුගලන් තෙරුන් ලවා දමනය කරවන්නාහු, මුනින්ද්‍රයන් වහන්සේ, ඍද්ධි උපදේශ විධියෙන් ජයගත් සේක. ඒ තේජසින් ඔබට ජය මඟුල් වේවා.

දුග්ගාහ දිට්ඨි භුජගෙන සුදට්ඨ හත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුති මිද්ධි බකාභිධානං
ඤාණාගදෙන විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමංගලානි

වැරදි මත ගැනීමේ දැකුම නැමැති නාගයා විසින් බොහෝ සේ දෂ්ඨ කරන ලද අත් ඇති (හෙවත් බොහෝ වූ වැරදි මතයන්හි එල්බ සිටි) ඉතා පිරිසිදු ආලෝකයෙන් හා සෘද්ධියෙන් ද යුත් බක නම් බඹා, මුනින්ද්‍රයන් වහන්සේ, නුවණ නමැති බෙහෙත් විධියෙන් ජයගත් සේක. ඒ තේජසින් ඔබට ජය මඟුල් වේවා.

එතාපි බුද්ධ ජය මංගල
අට්ඨ ගාථා
යො වාචකො දින දිනෙ සරතෙ මතන්දි
හිත්වාන නෙක විවිධානි චුපද්දි වානි

මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො ස පඤ්ඤො

මේ බුදු ජය මඟුල් අටගය වුව ද, යමෙක් දිනක් දිනක් පාසා නොකම්මැළිව කියමින් සිතෙහි දරා ද, ඒ නුවණැති මිනිස්තෙමේ අනේක වූ ද විවිධ වූ ද උපද්‍රවයන් අතැර මොක්ෂ සුඛය හෙවත් නිර්වාණය අවබෝධ කරන්නේ ය.

පින් අනුමෝදන් කිරීම

ඉච්චේවමච්චන්ත නමස්සනෙය්‍යං
නමස්සමානො රතනත්තයං යං
පුඤ්ඤාභිසන්ධං විපුලං අලද්ධං
තස්සානු භාවෙන හතන්තරායො

ආර්ය ත්‍රිවිධ රත්නය වැඳුම් පිදුම් කිරීමෙන් රැස් කරගත්තා වූ පින් අති මහත් ය. එම පින් වල බලයෙන් මාගේ අන්තරායන් අවසන් වේවා.

ඉමිනා පුඤ්ඤ කම්මේන
උපජ්ඣා ගුණුත්තරා
ආචරි යූප කාරාච
මාතා පිතා පියා මමං

මේ කුශලානුභාව බලයෙන් මාගේ ආචාර්ය උපාධ්‍යාය ගුණෝත්තම උතුමෝ ද, උපකාරකයෝ ද, ප්‍රිය මවුපිය දෙගුරුන් ද,

සුරියො චන්දිමා රාජා
ගුණවන්තානරාපිච
බ්‍රහ්මා මාරාච ඉන්දාච
ලොකපාලාච දේවතා

චන්ද්‍ර සූර්ය රාජයෝද, ගුණවත් මනුෂ්‍යයෝද, බ්‍රහ්මයෝද, මාරයෝද, ඉන්ද්‍රයෝද, ලෝක පාලක දෙවියෝද,

යමො මිත්තා මනුස්සාච
මජ්ජත්තා වෙරිකාපිච
සබ්බේ සත්තා සුඛී හොන්තු

පුඤ්ඤදානි පකතානිමෙ

යම දෙවි රජු ද, මිත්‍ර මනුෂ්‍යයෝද, මධ්‍යස්ථයෝද, වෛරීහුද, සියළු සත්වයෝද සුවපත් වෙත්වා.

සුඛංච තිවිධං දෙන්තු
ඛිප්පං පාපෙථ වො මතං
ඉමිනා පුඤ්ඤ කම්මෙන
ඉමිනා උද්දිසේනච

මවිසින් විශේෂයෙන් රැස්කරන ලද කුශලයෝ ත්‍රිවිධ සම්පත් දෙත්වා. භවත්හු වහා නිවනට පමුණුවනු ලබත්වා.

ඛිප්පා හන්තුලභෙ චෙව
තණ්හුපාදාන ඡෙදනං

යෙ සන්තානේ හීනාධම්මා
යාව නිබ්බානතො මමං

මේ කුශලයෙන් ද මේ උදෙසීමෙන් ද මම තෘස්ණා උපාදානයක් සිඳීම වහා ලබම්වා.

නස්සන්තු සබ්බදායෙව
යත්ථ ජාතො භවෙ භවෙ
උජු චිත්තො සතිපඤ්ඤො
සල්ලෙඛො විරිය වාමිනා

නිවන දක්වා මගේ සන්තානයේ පාප ධර්ම නොපිහිටේවා. උපනුපන් භවයක් පාසා සෑම කල්හි සෘජු සිත් ඇත්තේ සෘති ප්‍රඥා ඇත්තේ, සල්ලේඛ ප්‍රතිපදා

ඇත්තේ, වීර්යය ඇත්තේද
වෙම්වා!

මාරාලභන්තු නොකාසං
කාතුං ච විරියෙතු මෙ
බුද්ධා දීපවරො නාථො
ධම්මො නාථො වරුත්තමො

මේ කුශලයෙන් මාරයෝ අවකාශ
නොලබත්වා. මා හට වීර්යය කිරීම
පිණිස බුද්ධරත්නය උතුම් පිහිටය.
ධර්ම රත්නය ද මට උතුම් පිහිටය

නාථො පච්චෙක සම්බුද්ධො
සංඝො නාථොත්තරො මමං
තෙ සොත්තමානු භාවෙන
මාරො කාසං ලභන්තු මා

ප්‍රත්‍යෙක බුද්ධ රත්නය ද ආර්ය
මහා සංඝරත්නය ද මා හට
උතුම් පිහිටය. ඒ උත්තම
රත්නත්‍රයානුභාවයෙන් මාරයෝ
අවකාශ නොලබත්වා.

ආකාසට්ඨා ච භූම්මට්ඨා
දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු ලොකසාසනං

අහසෙහි පොළොවෙහි වෘක්ෂ
පර්වතාදියෙහි
අධිගෘහිත වූ මහත් සෘද්ධි ඇති
දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද, පින්
අනුමෝදන්ව සාසනය බොහෝ
කල් රකිත්වා.

ආකාසට්ඨා ච භුම්මට්ඨා
දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු දේසනං

අහසෙහි පොළොවෙහි වෘක්ෂ
පර්වතාදියෙහි අධිගෘහිත වූ
මහත් සෘද්ධි ඇති දෙවියෝ ද,
බ්‍රහ්මයෝ ද, පින් අනුමෝදන්ව
ධර්මය බොහෝ කල් රකිත්වා.

ආකාසට්ඨා ච භුම්මට්ඨා
දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු මං පරං

අහසෙහි පොළොවෙහි වෘක්ෂ
පර්වතාදියෙහි

අධිගෘහිත වූ මහත් සෘද්ධි ඇති දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද, පින් අනුමෝදන්ව මා ද අන්‍යයන් ද යහතින් බොහෝ කල් රකිත්වා.

දේවො වස්සතු කාලෙන
සස්ස සම්පත්ති හේතු ච
පීතො භවතු ලොකො ච
රාජා භවතු ධම්මිකො

කලට වැසි වසීවා. ගොවිතැන් දියුණු වේවා. රට සශ්‍රීක වේවා. රජ දැහැමි වේවා.

කායෙන වාචා චිත්තෙන
පමාදෙන මයා කතං

අච්චයං ඛම මෙ භන්තෙ
භූරිපඤ්ඤ තථාගත

ම විසින් සිතින් හෝ කයින් හෝ වචනයෙන් හෝ යන තුන් දොරින් නොදැනුවත්ව සිදු කරන ලද යම් වරදක් වේ නම් ඒ වරදට බුදුරජාණන් වහන්සේ මට සමාව දෙන සේක්වා.

සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානය,
නොම්මර 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607
ටෙලි +65 67783330 +65 94656570
weragodas1941@gmail.com

පූජ්‍ය වේරගොඩ සාරද නාහිමියන් විසින් සම්පාදනය කරන ලද පොත් පත් කියවීමට සහ පාලි සජ්ඣායනා ශ්‍රවණයට පහත සබැඳියාවට ප්‍රවේශ වන්න.

https://archive.org/ details/@ven_weragoda_sarada or the QR Code.